VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# ශ්‍රී ලංකාව ආදායම් වර්ධනය පිළිබඳ වර්ථා තබද්දී තරගකාරීත්වය තුළ පසුබෑමක්

ගෝලීය තරගකාරීත්ව දර්ශකය යනු ලෝක ආර්ථික සංසදය මගින් ලෝකයේ විවිධ ආර්ථිකයන්හි තරගකාරීත්වය මැනීම සඳහා සකස් කරනු ලබන දර්ශකයකි. 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව මෙම දර්ශකය තුළ 65 වන ස්ථානයට පත්වූ අතර 2014 දී පසුබෑමකට ලක් වෙමින් 73 වන ස්ථානයට පත්වන ලදී. මෙම පසුබෑම සඳහා හේතු වූ කරුණු දෙස අවධානය යොමු කිරීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකය ඉදිරියේදී මුහුණ දෙන අභියෝග සහ එහි වර්තමාන තරගකාරීත්වය පිළිබඳව තක්සේරුවක් ලබාගත හැකි වේ.

<u>තරගකාරීත්වය යනු කුමක්ද? ඊට බලපාන හේතු මොනවාද?</u>

තරගකාරීත්වය යනු යම්කිසි ආර්ථිකයක් ගෝලීය වෙළඳපොල තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයෙහි දක්වන කාර්යක්ෂමතාවයයි. මෙහිදී යම්කිසි ආර්ථිකයකට අඩු ශ්‍රම හා සම්පත් භාවිතයකින් යුතුව කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක යෙදිය හැකිනම් එමගින් එහි තරගකාරීත්වය ඉහළ නංවා ගත හැකි වේ. තරගකාරීත්වය සඳහා කරුණු කිහිපයක් බලපෑ හැක. උදාහරණයක් ලෙස ශ්‍රම පිරිවැය අඩු මට්ටමක පැවතීම සඳහා බලපාන කරුණු තුනක් තිබේ ; (i) ශ්‍රමිකයන්ට ගෙවන වැටුප් ප්‍රමාණය අඩු වීම; (ii) ශ්‍රම ඵලදායීත්වය ඉහළ මට්ටමක පැවතීම (iii) නිෂ්පාදන ක්‍රමය හොඳින් සැලසුම් කර තිබීම නිසා ඒ සඳහා ගෙවිය යුතු ආයාසය අඩු වීම.

ගෝලීය තරගකාරත්ව දර්ශකය සකස් කිරීමේදී ඉහත කරුණු සියල්ලම සැලකිල්ලට ගැනේ. එනම් සමස්ත ලකුණු මට්ටම සකස් කිරීමේදී ආර්ථිකයේ විවිධ අංශයන්ට විවිධ බර තැබීම් ලබාදෙන අතර ඒ සඳහා එම ආර්ථිකයක් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අයත් වන අදියර (එනම්, මූලික අදියර - සාධක මත රඳා පවතී (Basic – Factor driven), මධ්‍යම අදියර - කාර්යක්ෂමතාව මත රඳා පවතී (Middle level – efficiency driven) හා දියුණු අදියර - නවෝත්පාදනය මත රඳා පවතී (Advaced – Innovation driven),) බලපානු ලැබේ. මෙම දර්ශකය මගින් ආර්ථිකයක අංශ 12 ක් ඇගයුම් කිරීමට ලක් කරන අතර එම අංශ 12, ඉහත සඳහන් අදියර තුන යටතේ බෙදා දක්වනු ලැබේ (ප්‍රදර්ශිතය 01).

<u>දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ කාර්යසාධනය සහ එහි වැදගත්කම</u>

තරගකාරීත්වය සඳහා බලපානු ලබන දර්ශකය පිළිබඳ රටවල් අතර සන්සන්දනයක් සිදුකිරීමේදී පෙනී යන්නේ එය එක් එක් ආර්ථිකයෙහි ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඒ.පු.ද.දේ.නි.) සමග සහ සම්බන්ධයක් දක්වන බවයි. ඒ අනුව මෙම දර්ශකය මගින් රටක ඒ.පු.ද.දේ.නි. ඉහළ යාමත් සමගම මධ්‍යම හා දියුණු අවධියට අයත්වන නිර්ණායකයන්ට ඉහළ බර තැබීමක් සිදු කරනු ලැබේ (ප්‍රදර්ශිතය 02).

2009 දී ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් 2000 ක ඒ.පු.ද.දේ.නි. මට්ටම අභිබවා ගිය අතර වර්තමානයේදී ඇ.ඩො. 3000 ක කඩඉම ද ඉක්මවා ගොස් ඇත. ඒ අනුව මෙම දර්ශකයේ විවිධ නිර්ණායක තුළ ශ්‍රී ලංකාව සම්බන්ධව (මධ්‍යම හා දියුණු අදියර තුළ) බර තැබීම් ද පසුගිය කාලය තුළ ඉහල ගොස් ඇති අතර මූලික අදියර සඳහා ඇති බර තැබීම් පහළ ගොස් ඇත.

ගෝලීය තරගකාරීත්ව දර්ශකය මගින් යොදාගනු ලබන ක්‍රමවේදය මගින් ශ්‍රී ලංකාවට ඉතා වැදගත් පණිවිඩයක් ලබාදෙයි. එනම්, ශ්‍රී ලංකාව දැනට සිටින ඒ.පු.ද.දේ.නි. මට්ටමේ සිට ඉහළට යෑම සඳහා ආර්ථික කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට හේතුවන සාධක මත දැඩි රඳාපැවැත්මක් දක්වීමට සිදුවන බවයි.

<u>ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ගැටළු</u>

මෙම දර්ශකය තුළ ශ්‍රී ලංකාව මුහුණු පා ඇති ප්‍රධාන ගැටළුව වන්නේ 'මූලික අදියර - සාධක මත රඳා පවතී (සුළු වැටුප්' මට්ටමේ) සිට අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ඉහළ ඒ.පු.ද.දේ.නි. මට්ටමක සිටින බවයි. මධ්‍යම හා දියුණු අදියර තුළ ශ්‍රී ලංකාව පසුගාමී තලයක පසු වේ.

මෙම දර්ශකයේ ප්‍රධන අංශ තුනෙන් එකක් වන 'මධයම අදියර - කාර්යක්ෂමතාව මත රඳා පවතී' යන අංශය තුළ ශ්‍රී ලංකාවේ ස්ථානය 69 සිට 75 දක්වා පහත වැටී ඇත. මේ සඳහා එහි අනු කොටස් 4ක පසුබෑම සෘජුව බලපා ඇති අතර අනු කොටස් 2ක් නොවෙනස්ව පැවතිණි (ප්‍රදර්ශිතය 03).

ශ්‍රී ලංකාව 'මූලික අදියර - සාධක මත රඳා පවතී' යන අංශය තුළ ද ශ්‍රී ලංකාව එතරම් සාර්ථකත්වයක් අත්කරගෙන නොමැත. ආයතන (Institutions) සහ යටිතල පහසුකම් (Infrastructre) යන අංශ දෙක තුළ පසුබෑමකට ලක් වී ඇති අතර 'සාර්ව ආර්ථික පරිසරය' (Macroeconomic environment) යන අංශය තුළ යම්කිසි ප්‍රගතියක් ළඟා කර ගැනීමට හැකි වුව ද එය ඉතා පහළ ශ්‍රේණියක එනම් 114 වන ස්ථානගෙහි පසු වේ. මෙහි සෞඛ්‍යය හා ප්‍රාථමික අධ්‍යාපනය (Health and Primary Education) යන අංශය තුළ පමණක් ශ්‍රී ලංකාව ඉහළ ශ්‍රේණියක් අත්කර ගැනීමට සමත් වී ඇත.

<u>රාජ්‍ය හා පුද්ගලික අංශයන්ට පණිවිඩයක්</u>

මෙම දර්ශකයෙහි දියුණුවක් සහ පසුබෑමට ලක් වූ අනු කොටස් දෙසට අවධානය යොමු කිරීම මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට පණිවිඩයක් ලබා ගත හැක. කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට තුඩුදෙන සාධක තුළ ශ්‍රී ලංකාව ප්‍රබලම පසුබෑමට ලක් වී ඇත්තේ 'උසස් අධ්‍යාපනය සහ පුහුණු කිරීම්'(Higher education and training) යන අනු කොටස් තුළය (එනම්, ශ්‍රේණි 10 ක පසුබෑමක්). මෙම කාල සමාව තුළම ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය, විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය සඳහා ලබාදෙන ප්‍රතිපාදන ඉහළ නංවන ලෙසට ඉතා පුළුල් කතිකාවතක් පැවතුණ ද ඒ සඳහා රජය මගින් සැලකිය යුතු අවධානයක් යොමු නොකරන ලදී.

තවද, ශ්‍රී ලංකාව 'ශ්‍රම වෙළඳපොලෙහි කාර්යක්ෂමතාවය' (Labour market efficiency) යන අනු කොටස් තුළ ද 135 වැනි (ඉතා අඩු ශ්‍රේණියක* රැඳෙමින් ඉතා දුර්වල කාර්යසාධනයක් පෙන්වා ඇත. මෙම අංශයන් දෙකම රාජ්‍ය ප්‍රතිපත්ති හා රඳා පවතී.

භාණ්ඩ වෙළඳපොල තුළ තරගකාරිත්වය (Goods market efficiency) යන අංශය තුළ ශ්‍රී ලංකාව ඉහළ ශ්‍රේණියක් අත්කර ගැනීමට සමත් වී ඇති අතර මෙම පෞද්ගලික අංශය මත රඳා පවතින සාධකයකි. නමුත් මේ තුළ ද පසුගිය වසරෙහි ස්ථාන/ශ්‍රේණි දෙකක පමණ පසුබෑමක් සිදු වී ඇත.

පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයට ම හක හා සමාන වගකීමක් පවතින ක්ෂේත්‍රයන් දෙකක් පවතී. ඉන් පළමුවැන්න, මූල්‍ය වොළඳපොල සංවර්ධනයය (Financial market development) මෙම අංශයෙහි ශ්‍රී ලංකාව 41 වන ස්ථානයෙහි පසු වූ අතර මෙම වර්ෂයේදී ස්ථාන 6 ක පසුබෑමට ලක් වෙමින් 47 වන ස්ථානයට පත් වී ඇත. දෙවැනි අංශය වන්නේ 'තාක්ෂණික සූදානමයි' (Technological readiness). මෙම අංශය තුළ ශ්‍රී ලංකාව 93 වැනි ස්ථානය වැනි දුර්වල ස්ථානය රැඳී සිටිමින් මෙවර 94 දක්වා පසුබෑමට ලක් වී ඇත.

මෙම දර්ශකයේ දියුණු අදියර තුළ ශ්‍රී ලංකාව ව්‍යාපාරික විදග්ධතාවය (Business sophistication) සහ නිෂ්පාදනය තරමක් ඉහළ ශ්‍රේණියක රැඳීමට සමත් වී ඇතත් නවෝත්පාදනය (innovation) යන අංශය තුළ එය යම්කිසි පසුබෑමකට ලක්ව ඇත. පෞද්ගලික අංශය මේ සඳහා ඉහළ දායකත්වයක් ලබාදෙන අතර කාර්යක්ෂම ඉහළ නැංවීමට තුඩුදෙන සාධක (Efficiency drivers) තුළ ද සිදුවූ පසුබෑම් වල හානිය අවම කර ගැනීමට පෞද්ගලික අංශය මූලික වී ඇති බව පෙනී යයි.

<u>සන්සන්දනය සඳහා නිසි පැවැත්මක් සැකසීම හා ඒ සඳහා අවධානය</u>

ශ්‍රී ලංකාව අන්තර්ජාතික ආර්ථික ඇගයීම් තුළ සාර්ක් කලාපයේ අනෙකුත් රටවලට ඉහළින් රැඳී සිටීමට සමත් වී ඇති අතර එය ඉතා ඉහළ ජයගහනකි. ගෝලීය තරගකාරීත්ව දර්ශකය තුළ ද ශ්‍රී ලංකාවට වඩා ඉහළ ශ්‍රේණියක් ඇති එකම සාර්ක් රට වන්නේ ඉන්දියාවයි (71 වන ස්ථානය).

නමුත්, ශ්‍රී ලංකාව සිය දළ දේශීය නිෂ්පාදිතය අනෙකුත් දකුණු ආසියාතික රටවලට වඩා වේගයෙන් වර්ධනය කර ගැනීමට ප්‍රයත්න දරන මොහොතක දකුණු ආසියාතික රටවල් හා සන්සන්දනයක් සිදු කිරීම එතරම් තාත්වික නොවේ. ඒ සඳහා වඩාත් යෝග්‍ය වන්නේ චීනය, තායිලන්තය වැනි රටවල් යොදා ගැනීමයි.

පශ්චාත් යුධ සමය තුළ ශ්‍රී ලංකාව ඉහළ වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී. එමෙන්ම මෙම වර්ධනයෙහි තිරසාර බව පිළිබඳව ද විශාල කතිකාවතක් පැවතිණි. ගෝලීය තරගකාරීත්ව දර්ශකය හා එහි අනු කොටස් විශ්ලේෂණය කිරීමෙන් අදහස් වන්නේ රටක ආර්ථික වර්ධනය ඉතා විශාල ලෙස ආර්ථිකයේ ඵලදායිත්වය වර්ධනය කිරීම මත රඳා පවතින අතර ඒ සඳහා ආර්ථික කාර්යක්ෂමාතවය නංවන සාධක ඉතා වැදගත් වන බවයි. ඒ අනුව ශ්‍රම පිරිවැය මත රඳා පවතින වර්ධනය තිරසාර නොවන අතර එය වර්තමානයේ සිදුවන ලෙසට ශ්‍රමිකයන් ශ්‍රම බලකායෙන් ඉවත් වීම හෝ රැකියා සඳහා සංක්‍රමණය වීම තවත් දිරිගන්වනු ඇත. ආදායම ඉහළ යාම හා

තරගකාරීත්වය අඩුවීම යන ප්‍රවණතාවය තිරසාර නොවේ. ආර්ථිකයේ තරගකාරීත්වය ඉහළ නොයන්නේ නම් එමගින් ආර්ථික වෘද්ධිය සඳහා ඇති අවකාශය ද අවහිර කරනු ඇත.

**ප්‍රදර්ශිතය 01 : තරගකාරීත්වය සඳහා බලපානු ලබන සාධක (රටක සංවර්ධන මට්ටම අනුව)**

| මූලික අදියර :<br>සාධක මත රඳා පවතී | මධ්‍යම අදියර :<br>කාර්යක්ෂමතාව මත රඳා පවතී | දියුණු අදියර -<br>නවෝත්පාදනය මත රඳා පවතී |
|---|---|---|
| 1. ආයතන<br>2. යටිතල පහසුකම්<br>3. සාර්ව ආර්ථික පරිසරය<br>4. සෞඛ්‍යය හා ප්‍රාථමික පහසුකම් | 5. උසස් අධ්‍යාපනය හා පුහුණුව<br>6. භාණ්ඩ වෙළඳපොලෙහි කාර්යක්ෂමතාවය<br>7.ශ්‍රම වෙළඳපොලෙහි කාර්යක්ෂමතාවය<br>8. මූල්‍ය වෙළඳපොලෙහි සංවර්ධනය<br>9. තාක්ෂණික සූදානම<br>10. වෙළඳපොල ප්‍රමාණය | 11. වෙළඳපොල විදග්ධතාවය<br>12. නවෝත්පාදනය |

**ප්‍රදර්ශිතය 02 : අනු දර්ශකය තුළ විවිධ සාධක සඳහා බර තැබීම්**

| සාධක සඳහා බර තැබීම් | අදියර 1 සාධක මත රඳා පවතී | අදියර 1 සිට අදියර 2 දක්වා සංක්‍රාන්තිය | අදියර 2 කාර්යක්ෂම තාවය මත රඳා පවතී | අදියර 2 සිට අදියර 3 දක්වා සංක්‍රාන්තිය | අදියර 3 නවෝත්පාදනය මත රඳා පවතී |
|---|---|---|---|---|---|
| ඒක පුද්ගල දල දේශීය ඇමරිකානු ඩොලර් | <2000 | 2000-2993 | 3000-8399 | 3000-17,000 | >17,000 |
| බර තැබීම් : සාධක මත රඳා පවතින කරුණු සඳහා | 60% | 40%-60% | 40% | 20%-40% | 20% |
| බර තැබීම් : කාර්යක්ෂමතාවය නැංවීමට දායක වන කරුණු සඳහා | 35% | 35%-50% | 50% | 50% | 50% |
| බර තැබීම් : නවෝත්පාදනය සහ ව්‍යාපාරික විදග්ධතාවය සඳහා | 5% | 5%-10% | 10% | 10%-30% | 30% |

**ප්‍රදර්ශිතය 03 : අනු දර්ශකයන් තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රේණි මට්ටමෙහි වෙනස්වීම්**

| අනු දර්ශකය | 2013/2014 ශ්‍රේණිය 148 | 2014/2015 ශ්‍රේණිය 144 | සිදුවූ වෙනස දිශාව |
|---|---|---|---|
| මූලික අවශ්‍යතාවයන් | 77 | 75 | ▲ |
| ආයතන | 54 | 62 | ▼ |
| යටිතල පහසුකම් | 73 | 75 | ▼ |
| සාර්ව ආර්ථික පරිසරය | 120 | 114 | ▲ |
| සෞඛ්‍යය හා මූලික අධ්‍යාපනය | 52 | 45 | ▲ |
| කාර්යක්ෂමතාවය නංවන සාධක | 69 | 75 | ▼ |
| උසස් අධ්‍යාපනය හා පුහුණුව | 62 | 72 | ▼ |
| භාණ්ඩ වෙළඳපොළෙහි කාර්යක්ෂමතාවය | 37 | 39 | ▼ |
| ශ්‍රම වෙළඳපොළෙහි කාර්යක්ෂමතාවය | 135 | 135 | - |
| මූල්‍ය වෙළඳපොල සංවර්ධනය | 41 | 47 | ▼ |
| තාක්ෂණික සූදානම | 93 | 94 | ▼ |
| වෙළඳපොල ප්‍රමාණය | 61 | 61 | - |
| නවෝත්පාදනය සහ ව්‍යාපාරික විදග්ධතාවය | 42 | 43 | ▼ |
| නවෝත්පාදනය | 34 | 39 | ▼ |
| ව්‍යාපාරික විදග්ධතාවය | 49 | 46 | ▲ |

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් [insights@veriteresearch.org](mailto:insights@veriteresearch.org) වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**